**ශීර්ෂය 266 - වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124 (2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125 (1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3. විගණන විෂය පථය**

---

ශීර්ෂය 266 - වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම් මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසි වලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 මැයි 30 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කල හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.16 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 - ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරියා විසින් විධිවිධානයට අනුගත වී නොතිබීම්** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි.<br>2. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම. | 2.1.1<br>2.13 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | රජයේ නිලධාරීන්ට ඇප තැන්පත් ලබා ගැනීම. | 2.16 |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු. | 2.10 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශනය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු. | 2.4 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව. | වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රමාද වී ඉදිරිපත් කිරීම. | 2.1.2 |
| 128(1)(උ) | රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම පිළිබඳ ප්‍රගතිය දැක්වෙන වාර්තා නිතිපතා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට යවන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශයේ අඩුපාඩු. | 2.10 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම. | 2.10.1 |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව. (මු.රෙ.150 බලන්න) | විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.9 |
| 128(1)(ඡ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම | මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.16 |

කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව.

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---------------------------------------------

**2.1 කාර්යසාධනය**

--------------------

**2.1.1 සැලසුම් කිරීම**

--------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**2.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

-----------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, එම වාර්තාව 2018 ජූනි 05 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.

**2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම.**

------------------------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු.මිලියන 69.818 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 69.790 ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

**2.2.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------

වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නියැදි විගණන පරීක්ෂාවේ දී අවස්ථා 06 ක දී රු.796,279 ක මිලදී ගැනීම් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත සිදුකර ඇතත් 2017 වර්ෂයේ පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුව සඳහා දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය 2017 නොවැම්බර් 10 දින තෙක්ම ලැබී නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2(අ) ප්‍රකාරව මිල ගණන් කැඳවීමේදී භාණ්ඩවල වර්ගය, මාදිලිය යනාදී විස්තර පැහැදිලිව සඳහන් කළ යුතු වුවත් එසේ සිදු නොකර ප්ලාස්ටික් පුටු 204 ක් මිලදී ගැනීම සඳහා රු.199,716 ක් ගෙවා තිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 (ආ) ඡේදයේ විධානයන්ට පටහැනිව ගිණුම් අංශය සහ ආයතන අංශයේ ඇළුමිණියම් දොරවල් සහ සවිකිරීම සඳහා රු. 68,500 ක් පෞද්ගලික ආයතනයක් වෙත ඍජු කොන්ත්‍රාත් මත ගෙවා තිබුණි.

(ඈ) 2012 පෙබරවාරි 23 දිනැති ප්‍රසම්පාදන අත්පොත සඳහා අතිරේකය 21 ප්‍රකාරව ලියාපදිංචි සැපයුම්කරුවන් තෝරාගත යුතු වුවත්, එසේ සිදු නොකර නාම පුවරු සැකසීම හා පවුල් ඉල්ලුම්පත් මුද්‍රණය සඳහා රු.98,213 වැයකර තිබුණි.

(ඉ) කාර්යාලයේ ඉහළ මාලයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා අංශ වෙන්කිරීමේ කොන්ත්‍රාත්තුවට රු.323,550 ගෙවා තිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.14.1ට යොමුව 2017 මාර්තු 15 දින නිකුත් කරන ලද අතිරේක 33 ප්‍රකාරව ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා මිල ගණන් ප්‍රජාපාදක සංවිධාන ඇතුළත්ව ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් වෙතින් කැඳවිය යුතු වුවත්, ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීම් කර තිබුණි.

(ඊ) ප්‍රසම්පාදන කමිටු සාමාජිකයෙකු ලෙස ප්‍රධාන ගණකාධිකාරී පත් කර රැස්වීම් 11 ක් වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටු සාමාජික දීමනා ලෙස රු148,000 ක් ද එම කමිටු රැස්වීම්වලටම මාණ්ඩලික නිලධාරියෙකු ලෙස සහභාගී වීම වෙනුවෙන් තවත් රු.88,500 ක දීමනාවක්ද ගෙවා තිබුණි.

(උ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.9.1 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවල සාමාජිකයන්ට, තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයන්ට සහ විකල්ප සාමාජිකයන්ට එම රැස්වීම් වලට සහභාගී වීම වෙනුවෙන් පමණක් ගෙවීම් කළ යුතු වුවද ප්‍රසම්පාදන පත් විවෘත කිරීමේ කමිටුවට පමණක් සහභාගී වී තිබුණු නිලධාරීන් 03 දෙනෙකු සඳහා එකතුව රු.39,500 ක් ප්‍රසම්පාදන කමිටු දීමනා වශයෙන් ගෙවා තිබුණි.

**2.3** කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - සංචාරක නිවාස අළුත්වැඩියාව
--------------------------------------------------------------------

2017 වර්ෂයේ ව්‍යාපෘති අංක GA/ EU/ 2017/14 යටතේ සංචාරක නිවාසයේ ජලය බැස යාම සඳහා රු.1,695,374 වැයකර කාණු පද්ධතියක් ඉදිකර තිබුණු අතර, මෙම කර්මාන්තය සඳහා ගෙවීම් කිරීමේදී ඉටු නොකළ කාර්යයන් වෙනුවෙන් රු.85,920 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. තවද අළුතින් ඉදිකර අවසන් කර තිබූ මෙම සංචාරක නිවාසය පරිහරණය කර නොතිබියදී නානකාමරවල ජල කරාම නැවත යෙදීම නිසා ඒ සඳහා පෙර දරන ලද රු.29,341 ක මුදල අනාර්ථික වැයක් ලෙස නිරීක්ෂණය විය.

**2.4 වත්කම් කළමනාකරණය**
**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වාහන උපයෝජනය**
**-----------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට පහත සඳහන් පරිදි වාහන 11 ක් පැවැති අතර, එම වාහනවලින් කිලෝ මීටර් 117,884 ක් ධාවනය කර තිබුණි. ඒ සඳහා ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු.1,459,305 ක්ද, වාහන සේවා කිරීම සඳහා රු. 398,443 ක්ද, වාහන අළුත්වැඩියා සඳහා රු.2,204,504 ක්ද හා වාහන රක්ෂණය කිරීම සඳහා රු.574,166 ක්ද වශයෙන් එකතුව රු.4,636,418 ක් වැය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාහන ධාවනය කිරිම සඳහා රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝ මීටරයක් සඳහා රු.39.33 ක් වැය කර තිබුණි.

**(ආ) නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව තිබුණු අංක 252-9899 දරන කැබ් රථය වර්ෂයකට වඩා අධික කාලයක් භාවිතයට ගෙන නොතිබුණි.

**(ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2018 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම වාර්තා 2018 අප්‍රේල් 19 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

## 2.5 බැදීම් හා බැරකම්

### 2.5.1 වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම

2017 අප්‍රේල් 27 දිනැති අංක 255 / 2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 04 ක් සලසා තිබුණු රු. 24,226,000 ප්‍රතිපාදනය රු.444,017කින් ඉක්මවා රු.446,907 ක බැදීම් ඇති කරගෙන තිබුණි.

## 2.6 පාඩු හා හානි

ජාතික සමඟිය හා සංහිදියා කාර්යාංශය මඟින් ආර්ථික සංවර්ධන ව්‍යාපෘති නැරඹීම සහ සහතිකපත් බෙදා දීම සඳහා 2017 ජුනි 01 දිනට සංවිධානය කරන ලද උත්සවයට ආරාධනා පත් සහ බැනර් සකස් කිරීම වෙනුවෙන් රු.66,300 ක් ගෙවා තිබුණු අතර එකී උත්සවය එදිනට පවත්වා නොතිබීම නිසා උක්ත වියදමින් රජයට පාඩුවක් වී තිබුණි.

## 2.7 විසඳා නොතිබුණු විගණන ඡේද

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
| --- | --- | --- |
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| (අ) 2015 | 3.6(ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු නිල නිවාස වසර 05 ට අධික කාලයක් විවිධ රජයේ ආයතන, දේශපාලන අධිකාරියට අයත් කාර්යාල වලට සහ පුද්ගලයින්ට ලබා දී තිබීම මඟින් නිළධාරින්ට නිවාස පහසුකම් ලබා දීම සීමා වී තිබුණු අතර එකී නිවාසවල කුළී ආදායම ද අහිමි වී තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) 2016 | 5.1(අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව තිබුණු අංක 17-8519 දරණ ත්‍රිවීලර් රථය වර්ෂ දෙකකට අධික කාලයක් භාවිතයට ගෙන නොතිබුණි.<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පාවිච්චි කරනු ලබන වාහන 07 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2.8 කළමනාකරණ දුර්වලතා

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වවුනියාව - රජයේ ඉඩම් බදුදීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් රජයේ ඉඩම් පුද්ගලයින් 08 දෙනෙකුට වර්ෂ 30 ක කාල පරිච්ඡේදයකට බදු දීම වෙනුවෙන් ලැබිය යුතු රු.1,605,315ක් වූ බදු මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. තවද 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥාපනතේ X කොටසේ විධිවිධාන යටතේ බද්ද වහාම අවසන් කිරීමටත්, බදු දීමනාකරුට ඉඩමට ඇති එහි භුක්තිය ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බදු කාල සීමාව මේ වන විට අවසන් වී තිබූ බදු ගැනුම්කරුවන් තිදෙනෙකුගෙන් කිසිදු බදු මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, බදු කරුවන් තිදෙනෙකුගෙන් හිඟ බදු මුදල් සඳහා වූ පොළිය නියමිත පරිදි අයකරගෙන නොතිබුණි.

(ඇ) ඉඩම් සංවර්ධන ආඥා පනතට අනුව එක් පවුලකට මඩ හා ගොඩ ඉඩම් අක්කර 1 බැගින් පමණක් අවසර පත්‍ර ලබා දිය හැකි නමුත් පවුල් 76 ක් විසින් අක්කර 217 ¼ හා පර්චස් 108 ක් සඳහා අවසර පත්‍ර ලබාගෙන තිබුණි.

## 2.9 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 165.08 | 145.24 | 19.83 | 12 |
| | මූලධන | 32.56 | 32.55 | 0.01 | 0.03 |
| | එකතුව | 197.64 | 177.79 | 19.84 | 10 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2014 | පුනරාවර්තන | 155.35 | 150.45 | 4.90 | 3 |
| | මූලධන | 148.10 | 147.83 | 0.26 | 0.17 |
| | එකතුව | 303.45 | 298.28 | 5.16 | 1.7 |
| 2015 | පුනරාවර්තන | 186.63 | 186.25 | 0.38 | 0.2 |
| | මූලධන | 76.62 | 75.82 | 0.80 | 1.04 |
| | එකතුව | 263.25 | 262.07 | 1.18 | 0.44 |
| 2016 | පුනරාවර්තන | 194.9 | 193.63 | 1.27 | 0.65 |
| | මූලධන | 60.00 | 59.82 | 0.18 | 0.3 |
| | එකතුව | 254.9 | 253.45 | 1.45 | 0.56 |
| 2017 | පුනරාවර්තන | 199.50 | 196.51 | 2.99 | 1.5 |
| | මූලධන | 82.00 | 81.39 | 0.61 | 0.74 |
| | එකතුව | 281.50 | 277.90 | 3.60 | 1.27 |

**විසර්ජන ගිණුම**
**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**
**-----------------------------**

i. මුදල් රෙගුලාසි 66 මඟින් වැය විෂයන් දෙකක් සඳහා ලබාගත් අමතර ප්‍රතිපාදන පිළිවෙලින් සියයට 23 ක් හා සියයට 51 ක් ඉතිරි වී තිබුණි.

ii. වැය විෂයයන් 02 ක් සඳහා එකතුව රු.මිලියන 3.8 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 3.27 පමණක් උපයෝජනය කිරීම නිසා අතිරික්තය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 ක් හා සියයට 16 ක් වී තිබුණි.

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**
**------------------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** වෙනත් අමාත්‍යාංශ 25 ක් හා දෙපාර්තමේන්තු 15 ක් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු.මිලියන 1,990.1 ක්, රු. මිලියන 24.6 ක් වශයෙන් එකතුව රු. මිලියන 2,014.7 ක් ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 1,905.7 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 109 ක් හෙවත් සියයට 5 සිට සියයට 16 දක්වා වූ පරාසයක ඉතිරි කිරීම් වාර්තා වී තිබුණි.

**(ii) දිවිනැගුම දෙපාර්තමේන්තුව**

NPPC 0804 දරන වාහනයේ ඉන්ධන දහනය ලීටරයකට කිලොමීටර් 7ක් වන අතර අනුයුක්ත නිලධාරියා විසින් ලබා ගනු ලබන ඉන්ධන දීමනාව වෙනුවෙන් සෑම මාසයකම මෙකී වාහනය කිලෝමීටර් 980 ක් ධාවනයේ යෙදිය යුතු විය. මාසික ධාවන සටහන අනුව 2017 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා මාස 10 ක කාලය තුළ ධාවනය කළ දුර ප්‍රමාණය කිලෝමීටර් 4,142 ක් වීම හේතුවෙන් ඉන්ධන සඳහා ලබාගත් අග්‍රිමයෙන් රු.101,413ක ඉතිරියක් සිදු වී තිබුණි.

**(iii) බන්ධනාගාර ප්‍රතිසංස්කරණ,පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය**

අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ඉදිකරනු ලබන නිවාස ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ඇස්තමේන්තුවේ අනු අංක 14 යටතේ නිවාස සඳහා දික් අඩි 117 ක වඩිම්බුවක් යෙදිය යුතු වුවත් එම කාර්යය ඉටු නොකළ වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිවාස 55 ක් හා වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිවාස 105 ක් සඳහා පිළිවෙලින් රු. 707,850 ක් හා රු. 1,351,350 ක් ගෙවා තිබුණි.

- සම්පූර්ණයෙන් වැඩ අවසන් නොකළ නිවාස වෙනුවෙන් වවුනියාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් නිවාස 15 ක් සහ සෙට්ටිකුලම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් නිවාස 02 ක් සඳහා සම්පූර්ණ මුදලම ගෙවීම හේතුවෙන් පිළිවෙලින් රු. 730, 000 ක් සහ රු.188,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- වවුනියාව දකුණ ප්‍රාදේශිය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් වැඩ අවසන් කර තිබුණු නිවාස 14 ක සහ සෙට්ටිකුලම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් නිවාස 06 ක නිවැසියන් වසරක කාලයක සිට පදිංචි වී නොතිබුණි.

- නිවාස යෝජනා ක්‍රමයට අදාල ගිවිසුමේ 1.5 හා 1.4 වගන්ති වල දැක්වෙන පරිදි නිවාස ඉදිකිරීමට තාක්ෂණික උපදෙස් හා මග පෙන්වීම් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් ලබා දිය යුතු වුවත් කාර්යාල බල ප්‍රදේශයේ නිසි ප්‍රමිතියෙන් ඉදි නොකල නිවසක් කඩා වැටී තිබුණි.

- සෙට්ටිකුලම් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් කන්දසාමිනගර් ග්‍රාමසේවා වසමේ එක් පුද්ගලයෙක් ඔහුට අයිති රූඩ් 02 ක ඉඩමක් සහිත නිවසක් තිබියදී වෙනත් රූඩ් 02 ක ඉඩමක් සඳහා උක්ත වර්ගයේ නිවාසයක් ලබාගෙන තිබුණි.

## 2.10 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### 2.10.1 පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 26601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 16.0 | 15.9 | 12.0 | 12.2 | 50.0 | 40.6 |

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සේවය හැර ගිය නිලධාරියකුගෙන් රු. 106,659 ක මුදලක් හිඟහිට තිබුණු අතර එම හිඟහිටි ශේෂය වර්ෂ 05 වඩා වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂය අයකර නොතිබුණි.

## 2.11 අග්‍රිම ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ අග්‍රිම ගිණුම් අංක 7002-0-0-284/17 දරන 2017 දෙසැම්බර් 31 දින වන විට ශේෂ එකතුව රු.36,456 ක් විය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වා තිබුණු අග්‍රිම ගිණුම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කර තිබුණු අග්‍රිම ඇස්තමේන්තුව අනුව මාසිකව ලබා ගැනීමට අපේක්ෂා කළ අග්‍රිමයන්, මාසික ඉල්ලුම් කළ අග්‍රිමයන් හා ලැබී තිබුණු අග්‍රිමයන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| මාසය | සැලැසුම් කළ පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිමය | ඉල්ලුම් කළ අග්‍රිමය | ලැබී තිබුණු අග්‍රිමය | සැලැසුම් කළ පරිදි ඉල්ලුම් කළ අග්‍රිමය අතර වෙනස | ඉල්ලුම් කළ අග්‍රිමය හා ලැබී තිබුණු අග්‍රිමය අතර වෙනස |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු. මිලියන |
| ජනවාරි | 28.0 | 28.0 | 34.8 | 00 | (6.8) |
| පෙබරවාරි | 38.0 | 38.0 | 37.4 | 00 | 0.6 |
| මාර්තු | 58.8 | 58.8 | 48.8 | 00 | 10.0 |
| අප්‍රේල් | 84.8 | 84.8 | 59.4 | 00 | 25.4 |
| මැයි | 154.3 | 154.3 | 38.8 | 00 | 115.6 |
| ජූනි | 154.3 | 154.3 | 73.9 | 00 | 80.5 |
| ජූලි | 169.3 | 169.3 | 205.0 | 00 | (35.7) |
| අගෝස්තු | 370.7 | 370.7 | 301.9 | 00 | 68.8 |
| සැප්තැම්බර් | 476.4 | 476.4 | 211.9 | 00 | 264.5 |
| ඔක්තෝබර් | 524.6 | 524.6 | 344.5 | 00 | 180.1 |
| නොවැම්බර් | 579.9 | 579.9 | 334.4 | 00 | 245.4 |
| දෙසැම්බර් | 620.5 | 620.5 | 444.8 | 00 | 175.7 |
| එකතුව | 3,259.6 | 3,259.6 | 2,135.6 | 00 | 1,124.1 |

(ආ) 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 03 කට අදාළව ලබා දී තිබූ එකතුව රු.90,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාස 01 ක සිට මාස 04 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් අග්‍රිම නිරවුල් කර තිබුණි.

**2.12 පොදු තැන්පත් ගිණුම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 86.2 ක් වූ අතර වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.මිලියන 6.8 ක මුදල් අදාළ කාර්ය භාරයන් ඉටු නොකර මාස තුනක සිට තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**2.13 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබූ බැව් නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|
| (අ) බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (ආ) ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(I) |

**2.14 අනුකූල නොවීම්**

**2.14.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) VIII පරිච්ඡේදයේ 9.1 ඡේදය | 29,338 | රජයේ නිවාඩු දිනයක් සමඟම ඊට පෙර හෝ පසුව එන වැඩ කරන දිනයේ සේවයට පැමිණ ඇති බවට තහවුරු කර ගත යුතු වුවද ඊට පටහැනි ගෙවීම් අවස්ථා 07ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන්ද අවස්ථා 10 ක් දිවි නැඟුම දෙපාර්තමේන්තුවේ ද නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. |

| | | | |
|---|---|---|---|
| (ii) | VIII පරිච්ඡේදයේ 10.1 ඡේදය | 22,611 | එදිනෙදා කරන දෙපාර්තමේන්තුමය වැඩ සඳහා නිවාඩු දින දීමනා ලබා ගත නොහැකි වුවත් නිලධාරීන්ගේ නිවාඩු දින වැඩ කිරීම් අනුමත ලිපිය ප්‍රකාරව සාමාන්‍ය රාජකාරී සඳහා නිවාඩු දින වැටුප් ලබා ගෙන තිබුණි. |
| (iii) | VIII පරිච්ඡේදයේ 10.1 (අ)ඡේදය | 22,368 | ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 10.1 ප්‍රකාරව නිවාඩු දින වැඩ කිරීම වෙනුවෙන් දීමනා ලබා ගැනීමේ දී සේවකයා පැය 08ක සේවා කාලයක් සම්පූර්ණ කළ යුතු වුවත්, අවස්ථා 09 කදී සේවා කාලය සම්පූර්ණ නොවී තිබිය දී ගෙවීම් සිදු කර තිබුණි. |

**(ආ)** **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | | |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 104 (1) (අ), (3) (අ) හා (4) | - | සමාලෝචිත වර්ෂයේ ජූලි මාසයේදී PA 4891 දරන වාහනය අනතුරට ලක්වීම සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව වගකිව යුත්තන් නිශ්චය කිරීම ප්‍රාරම්භක වාර්තාවක් නිකුත් කිරීම හා පූර්ණ වාර්තාවක් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

**(ඇ)** **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) | 1999 ඔක්තොම්බර් 08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 | - | වෙන් කළ වාහන පෞද්ගලික පරිහරණය සඳහා යොදාගනු ලබන්නේ නම් නිලධාරියාගේ මාසික වැටුපෙන් රු.350 ක් අය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ඊට පටහැනිව ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී වෙන් කළ වාහනය පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීම වෙනුවෙන් අයකිරීම් කර නොතිබුණි. |
| **(ඈ)** | අංක 2004/05 සහ 2005/11 දරන පළාත් ඉඩම් කොමසාරිස්ගේ චක්‍රලේඛ හා අංක 2008/04 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | - | චක්‍රලේඛ විධිවිධාන වලින් බැහැරව පහත සඳහන් පුද්ගලයන් සඳහා ඉඩම් සංවර්ධන බලපත්‍ර (LDO) නිකුත්කර තිබුණි. |

| | පුද්ගලයා | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| (i) | ග්‍රාම නිලධාරීන් | 21 |
| (ii) | බාල වයස්කරුවන් | 03 |
| (iii) | රජයේ නිලධාරීන්ට | 182 |

| | | | |
|---|---|---|---|
| | | | (iv) විදේශ පුරවැසිභාවය හිමි විදේශගත වූවන්ට 58 |
| (ඇ) | 2010 දෙසැම්බර් 19 දිනැති අංක 04/2010 දරන පරිසර අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛය | - | පලු, බුරුත වැනි ශාක කැපිය නොහැකි වුවද ප්‍රාදේශීය ලේකම් විසින් පෞද්ගලික හිමිකරුවන් වෙත ලබා දී තිබූ රජයේ ඉඩම්වල පලු හා බුරුත ගස් පිළිවෙලින් 374 ක් හා 77 ක් කපා ඉවත් කිරීම සඳහා අවසර ලබාදී තිබුණි. |
| (ඉ) | අංක 2005/06 දරන පළාත් ඉඩම් කොමසාරිස්ගේ චක්‍රලේඛය හා අංක 2002/05 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | - | ඉඩම් සංවර්ධන ආඥා පනතේ අංක 104,106 සහ 109 දරන වගන්ති වලට පටහැනිව රජයේ නිලධාරීන් 49 දෙනෙකුට ඉඩම් බලපත්‍ර ලබා දී තිබුණි. |

## 2.15 මානව සම්පත් කළමනාකරණය

### 2.15.1 අනුයුක්ත කාර්යය මණ්ඩලය, තථ්‍ය කාර්යය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 152.7 ක් වැය කර තිබුණි.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| i. ජ්‍යෙෂ්ඨ මට්ටම | 33 | 28 | 05 |
| ii. තෘතියික මට්ටම | 20 | 09 | 11 |
| iii. ද්විතියික මට්ටම | 451 | 352 | 99 |
| iv. ප්‍රාථමික මට්ටම | 67 | 60 | 07 |
| v. අනියම්/ කොන්ත්‍රාත් | - | - | - |
| එකතුව | 571 | 449 | 122 |

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුරප්පාඩුව පවතින කාර්යාල කාර්ය සහයක තනතුරු 02 ක් සඳහා අනියම් පදනමින් බඳවා ගත් සේවකයන් දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ වැටුප් සහ දීමනා ලෙස රු.723,896 ගෙවා තිබුණු අතර මෙකී තනතුරු සඳහා ස්ථිර සේවකයන් බඳවා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

## 2.16 රජයේ නිලධාරීන් ඇප තැබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මුදල් භාරගැනීම සහ භාරව සිටින නිලධාරීන් සහ ගබඩාව භාරව කටයුතු කරන නිලධාරීන් 99 ක් විසින් මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව ඇප තැන්පත් කර නොතිබුණි.